


# මේ මොහොත තීරණාත්මකයි

දශකත්‍රයකට ආසන්න කාලයක් ශ්‍රී ලංකාව ලෙයින් කඳුලින් තෙත් කළ ත්‍රස්තවාදය සිය අවසන් ජවනිකාවට අවතීර්ණවී තිබේ. "දමිළ විමුක්ති අරගලය" ලෙස වේලුපිල්ලේ ප්‍රභාකරන් හඳුන්වන ලද එහි සැබෑ ත්‍රස්තවාදී හැඩරුව ලොවට පෙන්වීමට වත්මන් රජයට හැකි වී තිබේ. එය කවර තරාතිරමක ශ්‍රී ලාංකිකයෙකුගේ වුවද ප්‍රසාදයට හේතු වෙතැයි මම සිතමි.

_හමුදා නායකත්වය මුලකොට ගෙන ත්‍රස්තවාදයට එරෙහිව මෙහෙයුම් දියත් වූ පළමු අවස්ථාව මෙය වෙයි. ඊට පෙර යුධ ඉතිහාසය වූ කලි තනි දේශපාලන මෙහෙයුමක් විය. ත්‍රස්තවාදය යුධමය ලෙස මර්ධනය කළ නොහැකිය යන මිත්‍යාව නිර්මාණය කළෝ ඔවුහුය._

යුධ පිටිය ජයගත්තද එය රට හමුවේ තවත් ජයගත යුතු ප්‍රමුඛ ඉසව් රැසක් නිර්මාණය කරමින් තිබේ. එහි පළමු වැන්න නම් ප්‍රභාකරන්ගේ ග්‍රහණයෙන් මිදුන දමිළ මිනිසුන් දිනාගැනීමයි. එය කළ හැක්කේ ඔවුනට අනුකම්පා කොට ඔවුන් තම යටත් වැසියන් කිරීමෙන් නොව සැබෑ මිනිස්කමත් සමානාත්මතාවත් එම බිඳුන හදවත් වෙත තිළින කිරීම තුළිනි. එමෙන්ම ඔවුනගේ බිඳවැටුණු ආර්ථික ජීවිතය වහා ගොඩනැගීමද අනිවාර්ය අංගයක් වී තිබේ. මෙම කටයුත්තේදී රජයට මෙන්ම සෑම ශ්‍රී ලාංකිකයෙකුට අත්මිදිය නොහැකි වගකීමක් පැවරෙන බව මම සිතමි.

ප්‍රභාකරන්ගේ විමුක්ති දේශනා හමුවේ වියරු වැටුණු සුළු ජාතික මානසිකත්වය තේරුම්ගැනීම අනෙක් වැදගත් කරුණු වෙයි. එම මානසික වියවුල එක රැයකින් සමනය කළ හැකි වෙතැයි අප නොසිතිය යුතුය. එහෙත් එය කෙසේ හෝ කළ යුතුව තිබේ. ඊට දැනුවත් සමාජ ව්‍යාපාරයක් නිර්මාණය විය යුතුය. මහගම සේකර සිය "ප්‍රබුද්ධ" කෘතියේ එක් තැනක කරන ලද ප්‍රශ්න කිරීම සමාජ ගත කළ යුතු වඩාත් උචිත කාලය මෙය යැයි මම සිතමි. එනම්

"අසාධාරණට විරුද්ධව
යුධ වැදීමට
පෙළඹවිය හැකි නම් මිනිස් සිත
අසාධාරණ නො කර හිඳිනට
පෙළඹවිය නොහැකිද මිනිස් සිත ?

යුද්ධය පළමුවෙන්
බිහි වනුයේ සිතෙහි නම්
සාමය ද එතැනින් ම
බිහි කරනු බැරිවේ ද ?"

(ප්‍රබුද්ද - මහගම සේකර)

පශ්චාත් යුධ සමය තුළ එම ජන කොටස් එකම රටක ජීවත් විය යුතුය යන මානසික පුළුල් වූයේ මෙම පසුබිම යටතේය.

දැන් එළඹ ඇත්තේ රජය ඉතා ඥාණාන්විතව තීරණ ගතයුතු යුගයකට යැයි මම සිතමි. යුධ ජයග්‍රහණයේ උද්දාමය අඥාදායක පාලනයකට රට තල්ලු කරනු ලබයි. එය වලක්වා ගත යුතුව තිබේ. එහෙත් යුධ ජයග්‍රහණය මෙම පාදඩ දේශපාලන සංස්කෘතිය වෙනස් කරනු වස් පරිහරණය කළ හැකිය. එනම් රට තුළ නිර්මාණය විය යුතු නව රාජ්‍ය පාලනයකට මග කියන ව්‍යවස්ථාමය වෙනසක් වෙත ජන වරමක් ලබා ගනිමින් ඒ යටතේ විධිමත් ආර්ථික සංවර්ධන මූලෝපායන් සකසමින් නීතිගරුක සමාජයක් වෙත ආරම්භයක් ගත හැකිය. රූපියල් මගින් පාර්ලිමේන්තු බල තුළනය තීරණය වන ක්‍රමය වෙනුවට සැබෑ ජනමතය නියෝජනය වන ශක්තිමත් පාර්ලිමේන්තුවක් නිර්මාණය කරගැනීම තුළින් රටට ලබාදිය

***හමුදා නායකත්වය මුලකොට ගෙන ත්‍රස්තවාදයට එරෙහිව මෙහෙයුම් දියත් වූ පළමු අවස්ථාව මෙය වෙයි. ඊට පෙර යුධ ඉතිහාසය වූ කලි තනි දේශපාලන මෙහෙයුමක් විය. ත්‍රස්තවාදය යුධමය ලෙස මර්ධනය කළ නොහැකිය යන මිත්‍යාව නිර්මාණය කළෝ ඔවුහුය.***















විශ්වාසයෙන් සන්නද්ධ නොකොට දෙනු ලබන කවර දේශපාලන බල බෙදීමක් වුවද පලක් වෙතැයි සිතිය හැකි නොවේ. _දමිළ ජනයා දමිළ වීම නිසා ගැටලු පැන නැගුනේ නම් ඒ පරිපාලන ව්‍යුහය විසින් ඇති කරන ලද්දක් බව මම සිතමි. ප්‍රභාකරන් කරනු ලැබූයේ එකී පාලන ගැටලුවට ජාතිවාදී රූපාන්තරණයක් ලබාදීමයි._ ඊට ඇතැම් සිංහල හා දමිළ නායකයින්ගේ මුග්ධ දේශපාලන පිළිවෙත් ඉමහත් පිටුබලයක් විය. ප්‍රභාකරන්ගේ ඊලාම් සිතියමේ දේශසීමා හැකි ජයග්‍රහන බොහෝ තිබේ.

මේ මොහොත ඒ සඳහා ඉතිහාසය විසින් නිර්මාණය කරදුන් _"හොඳම දේශපාලන අවකාශය"_ බව මම සිතමි.

රවී සිරිවර්ධන
ravi.siriwardhana@gmail.com

*ඡායාරූප* - defence.lk *වෙබ් අඩවියෙනි*

# ලෙඩ හංගාගත් පරිගණක

වෛරස් ආසාදන පරිගණක ලෝකයට අමුතු දෙයක් නෙවෙයි. වෛරස් ආසාදනයකට ලක් වූ විට පරිගණක කඩා වැටීම (crash) නැත්නම් ක්‍රියා විරහිත වීම සාමාන්‍ය දෙයක්. පරිගණකයක් ආසාමාන්‍ය ලෙස ක්‍රියා විරහිත වනවා නම් වෛරස ආසාදනයක් බවට සැක කරන්නට අප පුරුදු වී සිටිනවා.

එහෙත් දැන් තත්වය එයට වෙනස්. දැන් දැන් පරිගණක වෛරස නිපදවන්නන් සිය වෛරසය නිසා පරිගණකයේ ක්‍රියාකාරීත්වය කිසිදු හානියක් නොවන ලෙස වෛරසය නිපදවන්න පෙළඹිලා තියෙනවා. හේතුව ඉතාම පැහැදිලියි. ඔබේ පරිගණකයේ ක්‍රියාකාරීත්වයේ කිසිදු වෙනසක් ඔබට පෙනෙන්නේ නැත්නම් එතුළ වෛරසයක් ඇතැයි ඔබ සැක කරන්නෙ නැහැ.

මේ නිසා වෛරසයට කිසිදු බාධාවකින් තොරව ඔබේ පරිගණකය තුළ පදිංචි වී තමාට අවශ්‍ය ලෙස ක්‍රියාත්මක වන්නට පුලුවන් වෙනවා. ඔබේ පරිගණක යතුරු පුවරුවේ ඔබ ඔබන යතුරු මතක තබාගෙන වෛරසය එවූ තැනැත්තාට ඒ විස්තර යවන්නට වෛරසයට පුලුවන්. මෙමගින් ඔබ ලෝක ව්‍යාප්ත ජාලයේ වෙබ් අඩවියකට ඇතුල් කරන ක්‍රෙඩිට්කාඩ් අංකය හෝ වෙනත් රහස් අංගයක් හෝ මතක තබාගෙන ඒ විස්තර වෛරස් නිපදවන්නාවෙත යැවීමට දැන් බාධාවක් නැහැ. එසේත් නැත්නම් ඔබේ පරිගණකයට තුළ පදිංචි ව සිටිමින් වෙනත් පරිගණක වලට ලෙඩ බෝ කරන්නටත් වෛරසයට පුලුවන්.

***ඔබේ පරිගණක යතුරු පුවරුවේ ඔබ ඔබන යතුරු මතක තබාගෙන වෛරසය එවූ තැනැත්තාට ඒ විස්තර යවන්නට වෛරසයට පුලුවන්. මෙමගින් ඔබ ලෝක ව්‍යාප්ත ජාලයේ වෙබ් අඩවියකට ඇතුල් කරන ක්‍රෙඩිට්කාඩ් අංකය හෝ වෙනත් රහස් අංගයක් හෝ මතක තබාගෙන ඒ විස්තර වෛරස් නිපදවන්නාවෙත යැවීමට වෛරසයට දැන් බාධාවක් නැහැ.***




එසේ නම් ඔබේ පරිගණකයට වෛරසයක් ඇතුල් තිබේ යයි දැනගන්නෙ කොහොම ද?ඃ

1 ඔබේ පරිගණකය අසාමාන්‍ය ලෙස හෙමින් ක්‍රියාත්මක වන්නට පටන් ගෙන තිබේ ද? යම්කිසි හානිකර පරිගණක වැඩ සටහනක් පසුබිමේ සිට ක්‍රියාත්මක වන බවට ලකුණක් තමයි ඒ.
2 ඔබට පාලනය කළ නොහැකි ලෙස පොප් අප් වෙළඳ දැන්වීම් පරිගණක තිරය මත දර්ශනය වනවාද? ඔබේ පරිගණකය "ඇඩ්වෙයා" නමින් හැඳින්වෙන හානිකර ආසාදනයකට ලක්ව ඇති බවට සැකයක් නැහැ.
3 ඔබට අවශ්‍ය නොවන වෙබ් අඩවි කරා ස්වයංක්‍රීයව ඔබ ගෙන යනවාද? මෙයත් වෛරස ආසාදයක රෝග ලක්ෂණයක්.

සැලකිළිමත් වන්න. නිතරම ඔබේ පරිගණකය වෛරස් ආසාදන වළක්වන ඇන්ටිවයිරස් වැඩ සටහනක් මගින් ආරක්ෂා කර තබන්න.

- ජගත්